
# විදුලි බලය

## විදුලි බලය ලබා ඇති පවුල් සංඛ්‍යාව හා මුළු පවුල් සංඛ්‍යාවෙන් ප්‍රතිශතය

2023 සිට 2024 දක්වා කාලය තුළ ගෘහ විදුලි පරිභෝජනය පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | මුළු පවුල් ගණන | මුළු නිවාස ගණන | විදුලිය ඇති නිවාස ගණන | විදුලිය නැති නිවාස ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2023 | 14324 | 14184 | 14098 | 86 | 99.39 % |
| 2024 | 14401 | 14274 | 14151 | 123 | 99.23 % |




2023 වසර වන විට 99.39 % ක් ව තිබූ විදුලි බලය ඇති නිවාස ප්‍රතිශතය 2024 වසරේ 99.23% දක්වා අඩු වී ඇත.

නිවාස සඳහා විදුලි බල භාවිතය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සපයා ඇති තොරතුරු අනුව විදුලිබලය ව්‍යාප්තවී ඇති රටාව දෙස බලන විට යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදුලිබලය ලබා දීම ඉතා ඉහළ මට්ටමක පවතින බව සඳහන් කළ යුතුය. (නිවාස සඳහා විදුලිබල භාවිතය පිළිබඳ තොරතුරු වගුවේ දැක්වේ)

# නිවාස සඳහා විදුලිබල භාවිතය ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් - 2024

| ග්‍රා.නි. අංකය | ග්‍රාම නිධාරි වසම | මුළු පවුල් ගණන | මුළු නිවාස ගණන | විදුලිය ඇති නිවාස ගණන | විදුලිය නැති නිවාස ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| 176 | කොට්ටව | 375 | 392 | 390 | 2 | 99.49 |
| 176 ඒ | නැවුංගල | 330 | 326 | 325 | 1 | 99.69 |
| 176 බී | කොට්ටව බටහිර | 525 | 525 | 522 | 3 | 99.43 |
| 176 සී | කොට්ටව  නැගෙනහිර | 333 | 333 | 329 | 4 | 98.8 |
| 176 ඩී | නැවුංගල දකුණ | 264 | 264 | 261 | 3 | 98.86 |
| 177 | තෙල්ලඹුර පහල | 369 | 369 | 368 | 1 | 99.73 |
| 177 ඒ | තෙල්ලඹුර ඉහල | 392 | 395 | 392 | 3 | 99.24 |
| 177 බී | නාවල | 327 | 326 | 324 | 2 | 99.39 |
| 177 සී | යක්කලමුල්ල | 430 | 406 | 404 | 2 | 99.51 |
| 177 ඩී | යක්කලමුල්ල නැගෙනහිර | 218 | 206 | 203 | 3 | 98.54 |
| 177 ඊ | තෙල්ලඹුර උතුර | 170 | 170 | 167 | 3 | 98.24 |
| 177 එෆ් | තෙල්ලඹුර දකුණ | 275 | 273 | 271 | 2 | 99.27 |
| 178 | කරාගොඩ | 285 | 287 | 286 | 1 | 99.65 |
| 178 ඒ | නබදව | 415 | 412 | 411 | 1 | 99.76 |
| 178 බී | මොරකැටිය | 494 | 473 | 471 | 2 | 99.58 |
| 178 සී | කරාගොඩ පහල | 235 | 235 | 233 | 2 | 99.15 |
| 178 ඩී | යටමලගල | 215 | 212 | 210 | 2 | 99.06 |
| 178 ඊ | කරාගොඩ ඉහල | 253 | 251 | 250 | 1 | 99.6 |
| 178 එෆ් | ගහළකොළදෙණිය | 359 | 353 | 349 | 4 | 98.87 |
| 179 | උඩුමලගල | 313 | 313 | 312 | 1 | 99.68 |
| 179 ඒ | නාකියාදෙණිය | 759 | 750 | 738 | 12 | 98.4 |
| 179 බී | වත්තහේන | 208 | 208 | 202 | 6 | 97.12 |
| 179 සී | නාකියාදෙණිය උතුර | 344 | 342 | 337 | 5 | 98.54 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 179 ඩී | වතෝගල | 334 | 332 | 326 | 6 | 98.19 |
| 179 ඊ | නාකියාදෙණිය ඉහල | 260 | 260 | 259 | 1 | 99.62 |
| 180 | පොල්පාගොඩ | 329 | 327 | 327 | 0 | 100 |
| 180 ඒ | බෙරණගොඩ | 516 | 512 | 507 | 5 | 99.02 |
| 180 බී | පොල්පාගොඩ බටහිර | 305 | 299 | 298 | 1 | 99.67 |
| 180 සී | හිරියමල්කුඹුර | 314 | 305 | 302 | 3 | 99.02 |
| 180 ඩී | කලුදියවල | 222 | 220 | 218 | 2 | 99.09 |
| 181 | වල්පල | 235 | 235 | 235 | 0 | 100 |
| 181 ඒ | වල්පල පහල | 361 | 350 | 349 | 1 | 99.71 |
| 181 බී | වෙළෙන්දාව | 397 | 392 | 389 | 3 | 99.24 |
| 181 සී | බදුංගල | 235 | 235 | 233 | 2 | 99.15 |
| 182 | මාගෙදර | 230 | 223 | 222 | 1 | 99.55 |
| 182 ඒ | උඩුඇල්ල | 328 | 328 | 325 | 3 | 99.09 |
| 182 බී | මාගෙදර උතුර | 223 | 219 | 216 | 3 | 98.63 |
| 182 සී | ඇල්ලඉහල | 420 | 430 | 420 | 10 | 97.67 |
| 182 ඩී | මාගෙදර නැගෙනහිර | 471 | 466 | 464 | 2 | 99.57 |
| 182 ඊ | රතඹලාකැටිය | 220 | 222 | 220 | 2 | 99.1 |
| 183 | තල්ගම්පල | 302 | 299 | 297 | 2 | 99.33 |
| 183 ඒ | උඩුබැට්ටව | 225 | 225 | 225 | 0 | 100 |
| 183 බී | තල්ගම්පල උතුර | 322 | 310 | 302 | 8 | 97.42 |
| 183 සී | උඩුබැට්ටව බටහිර | 264 | 264 | 262 | 2 | 99.24 |
| **එකතුව** | | **14401** | **14274** | **14151** | **123** | **99.43** |

**යෝජනා :-**

- කොට්ඨාසය තුළ විදුලිය නොමැති ප්‍රදේශ මේවන විට ඉතා අඩු ප්‍රමාණයක් පවතින අතර එම ප්‍රදේශවලට ද විදුලිය ලබාදීම සිදුකළ යුතුය.
- කොට්ඨාසය තුළ විදුලිය සපයා ඇති ප්‍රදේශ ගණනින් වැඩි වුවද අඩු සැර වොල්ටීයතාවය හා නිතර නිතර සිදුවන විදුලි සැපයුම බිඳවැටීම නිසා විදුලි පාරිභෝගිකයන් මහත් අසීරුතායකට පත්ව ඇති බැවින් එම කටයුතු ක්‍රමානුකූලව නඩත්තු කළ යුතුය.
- ප්‍රදේශයේ පිහිටා ඇති වටවල හා නිදංදොළ කුඩා ජල විදුලි බලාගාර වැඩි දියුණු කර ජාතික විදුලිබල නිෂ්පාදනයට එකතු කිරිම සුදුසුය. (ධාරිතාවය වැඩි කිරිම)

## මාර්ග

යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මාර්ග රටාව සලකා බැලීමේදී ගාල්ල උඩුගම මාර්ගය ප්‍රධාන මාර්ගය තල්ගම්පලට මදක් ඔබ්බෙන් කොට්ඨාසයට පිවිස නාකියාදෙණිය මන්සන්දියට මදක් ඔබ්බෙන් කොට්ඨාසයෙන් පිටවේ. මෙම කොට්ඨාසයේ ප්‍රධාන මාර්ග හා එහි දුර ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

| අංකය | මාර්ගය | කි.මී. ප්‍රමාණය |
|---|---|---|
| 01 | ගාල්ල - උඩුගම මාර්ගය | 15.36 |
| 02 | මාකුඹුර හන්දියේ සිට යක්කලමුල්ල හංදිය | 1.76 |
| 03 | යක්කලමුල්ල සිට අකුරැස්ස මාර්ගය | 8.0 |
| 04 | යක්කලමුල්ල සිට බටේමුල්ල මාර්ගය | 8.16 |
| 05 | කොට්ටව සිට වදුරඹ මාර්ගය | 3.36 |
| 06 | නාකියාදෙණිය සිට තලංගහ | 3.52 |

## ශ්‍රේණිගත මාර්ග

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රේණිගත මාර්ග - 2023


| මාර්ගය | ශ්‍රේණිය |
|---|---|
| ගාල්ල - උඩුගම ප්‍රධාන මාර්ගය | B (බස් ධාවනය වේ) |
| මාකුඹුර හන්දිය - යක්කලමුල්ල | B (බස් ධාවනය වේ) |
| යක්කලමුල්ල - කැටන්විල | B (බස් ධාවනය වේ) |
| යක්කලමුල්ල - ඉමදූව | B (බස් ධාවනය වේ) |
| පොල්පගොඩ - උඩුවිටියන හරහා තල්ගම්පල | E (බස් ධාවනය වේ) |
| යක්කලමුල්ල - වතෝගල පාර මොරකැටිය | E (බස් ධාවනය වේ) |
| මොරකැටිය ඉද්දකැටිය හරහා මාගෙදර | E (බස් ධාවනය වේ) |
| විලවල සිට උඩුවැල්ල රතඹලාකැටිය | E බස් ධාවනය වේ) |
| උඩුවැල්ල - මාගෙදර 04 කණුව | E (බස් ධාවනය වේ) |
| පොල්පාගොඩ - හිරිඹුරාව | E (බස් ධාවනය වේ) |
| යක්කලමුල්ල-නාවල | E (බස් ධාවනය වේ) |

*ශ්‍රේණියේ මාර්ග තාර දමා වැඩි දියුණු කළයුතු වේ. ශ්‍රේණියේ මාර්ග වල බස් ධාවනය වුවත් එය ප්‍රමාණවත් නොවේ. ලංගම බස් ධාවනය සඳහා යොදා ඇති වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. කොට්ඨාසය තුල අතුරු මාර්ගවල බස් රථ ධාවනය ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක නොවීම හා ප්‍රමාණවත් බස් රථ ප්‍රමාණයක් ධාවනයේ නොයෙදීම ගැටළුවකි. ඒ සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මාර්ග 8.1 සිතියමෙන් දැක්වේ.

සිතියම් අංකය :

## මාර්ග සිතියම - යක්කලමුල්ල ප්‍රා ලේ කොට්ඨාශය



# තැපැල් හා විදුලි සංදේශ සේවා

## තැපැල් සේවය

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තැපැල් සේවාව රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රධාන තැපැල් කාර්යාල එකක් (01) සහ උප තැපැල් කාර්යාල 09ක් රාජ්‍ය අංශය යටතේද උප තැපැල් කාර්යාල සණස සමිතිය යටතේ පෞද්ගලිකව ක්‍රියාත්මක වන එක් තැපැල් කාර්යාලයක් උඩුමලගල ප්‍රදේශයේද ක්‍රියාත්මක වේ. එසේම ලිපි බෙදා හැරීමේ උප තැපැල් කාර්යාල 06ක් ද වේ. ලිපි බෙදාහැරීමේ ස්ථාන යක්කලමුල්ල, මාගෙදර, කරාගොඩ, තල්ගම්පල, නාකියාදෙණිය, වල්පල වේ.

## කොට්ඨාසයේ තැපැල් කාර්යාල ව්‍යාප්තිය

| වසම් අංකය | ග්‍රාම නිලධාරි වසම | තැපැල් කාර්යාලයේ නම | ශ්‍රේණිය | දුරකතන අංකය | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 176 බී | කොට්ටව බටහිර | කොට්ටව උප තැපැල් කාර්යාලය | II | 091- 5625980<br>091- 2286051 | 04 |
| 177 බී | නාවල | නාවල කොස්ගහහේන උප තැපැල් කාර්යාලය | II | 091- 2237633 | 01 |
| 177 ඩී | යක්කලමුල්ල නැගෙනහිර | යක්කලමුල්ල තැපැල් කාර්යාලය | I | 091 - 2286052 | 08 |
| 177 එෆ් | තෙල්ලඹුර දකුණ | තෙල්ලඹුර උප තැපැල් කාර්යාල | II | 091 - 2285059 | 01 |
| 178 ඩී | යටමලගල | කරාගොඩ උප තැපැල් කාර්යාලය | II | 091 - 3903218 | 04 |
| 179 | උඩුමලගල | උඩුමලගල (සණස ඒජන්සි) තැපැල් කාර්යාලය | - | 091 -2237749 | 01 |
| 179 ඒ | නාකියාදෙණිය | නාකියාදෙණිය උප තැපැල් කාර්යාලය | II | 091–2285057<br>091- 5626071 | 11 |
| 181 | වල්පල | වල්පල උප තැපැල් කාර්යාල | II | 091 -2286046 | 04 |
| 182 | මාගෙදර | මාගෙදර උප තැපැල් කාර්යාලය | II | 091 -5625986 | 04 |
| 183 බී | තල්ගම්පල | තල්ගම්පල උප තැපැල් කාර්යාලය | II | 091 - 3901841 | 01 |

## විදුලි සංදේශ පහසුකම්

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදුලි සංදේශ හා දුරකථන පහසුකම් පෙරට වඩා දියුණුවක් දක්නට ඇත.

එහෙත් 2010 වසර වන විට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අමතරව පෞද්ගලික දුරකතන ජාලයක්ද ක්‍රියාත්මක වීමත් රැහැන් රහිත දුරකතන හඳුන්වා දීමත් නිසා කොට්ඨාසය තුළ දුරකතන භාවිතය සීග්‍රලෙස ඉහළ ගොස් ඇත. විශේෂයෙන්ම ජංගම දුරකතන භාවිතය ඉහළ ගොස් ඇති අතර රැහැන් රහිත ගෘහස්ත දුරකථන භාවිතය 2022 වන විට භාවිතය අඩු වීමක් දැකිය හැකිය.

බොහෝ දුරකතන ජාල වල තරංග කොට්ඨාසය පුරා එකසේ නොලැබෙන අතර මෙම දුෂ්කරතාවයන් මගහැරවීම සඳහා එටිසෙලාට්, ඩයලොග්, ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකාබෙල්, හච්සන් එයාර්ටෙල් යන ආයතන මගින් ප්‍රතිවිකාශන කුළුණු ඉදිකර ඇත. කොට්ඨාසය තුළ ප්‍රතිවිකාශණ කුළුණු ස්ථාපිත කර ඇති ස්ථාන අදාල ආයතන පිලිබඳ තොරතුරු පහතින් දැක්වේ.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | කුළුණ ස්ථාපනය කර ඇති ස්ථානය | දුරකතන ආයතනය |
|---|---|---|---|
| 1 | 176 ඒ නබඩව | මලන්දෙණිය කන්ද | ශ්‍රී ලංකා ටෙලිකොම්/ඩයලොග්/ලංකා බෙල් |
| 2 | 179 ඒ නාකියාදෙණිය | ගොඩහේන් කන්ද | එටිසලාට් කුළුණ |
| 3 | | ඩේවිඩ්සන් ප්‍රවේනි ඉඩම (පාසැල් කන්ද) | එටිසලාට් කුළුණ, ඩයලොග් කුළුණ |
| 4 | 176 ඩී නැවුංගල දකුණ | ඊරියගහවත්ත | ඩයලොග් කුළුණ |
| 5 | 178 ඒ නබඩව | මලන්දෙණිය - තෙල්හේන කන්ද | ඩයලොග්කුළුණ/ ටෙලිකොම්/ ලංකා බෙල් |
| 6 | 183 බී තල්ගම්පල උතුර | මණ්ඩගල කණ්ද | මොබිටෙල් |
| 7 | 183 ඒ උඩුබැට්ටව | ලෙව්වමීවත්ත,උඩුබැට්ටව, තල්ගම්පල | එයාර්ටෙල් |
| 8 | 183සී උඩුබැට්ටව | සුචරිතාරාමය - තල්ගම්පල | එටිසලාට් කුළුණ |

| | | | |
|---|---|---|---|
| | බටහිර | | |